**තුරුසවිය අරමුදල - 2020**

----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තුරුසවිය අරමුදල 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,610,331 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද වාහන ප්‍රත්‍යාගණන සිදු කරන අවස්ථාවේදීම මෙම කාර්යය සිදු කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වත්කම්වල ඵලදායි ජීවිතකාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී ජනාධිපති කාර්යාලයෙන් ලැබී තිබුණු එකතු වටිනාකම රු.22,600,000 ක් වූ වාහන 07 ක් නීත්‍යානුකූලව පවරාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන මෙතෙක් ආයතනයට ලියවිල්ලකින් පමණක් ලබාදී ඇති අතර, වාහනයේ බලපත්‍රය ආයතනයට පවරා නොමැති බැවින් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කොට නොමැති අතර, වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයේ වටිනාකම සටහන් නොකර පවත්වා ගෙන යනු ලැබේ. | වාහන නීත්‍යානුකූලව පවරාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් 2018 වර්ෂයේ වැවිලි අමාත්‍යාංශය වෙතින් ලැබුණු ලිබඩු උපකරණ ඒකක 89 ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | පරිත්‍යාග වත්කම්වග අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුවීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර, කෑගල්ල, රත්නපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 හි තුරුසවිය සමිති 30 ක් සඳහා ලබාදී ඇති අත්තිකාරම් සහ ණය මුදල්වලින් රු.826,109 ක් වූ ලැබිය යුතු ශේෂයක් වර්ෂ 05 ක කාලයක් පැවති නමුත් අයකර ගැනීමට නොහැකිව පැවතිණි. එසේම මෙම සමිති සමාලෝචිත වර්ෂය වන විට සක්‍රීය මට්ටමේ පවතින්නේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි. | ඉතිරි ශේෂය ලබාගැනීමට අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම හා/හෝ තත් ශේෂය කපා හැරිමට ඉදිරි කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරිමට අපේක්ෂා කරමි. | ණය අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අරමුදල විසින් ඉකුත් වර්ෂයේදී තුරුසවි සමිති 02 ක් සඳහා රු.500,000 ක් බැගින් මාස 06 ක් ඇතුළත ගෙවීමේ පදනම යටතේ සියයට 4 ක පොලියට ලබාදුන් රු.1,000,000 ක ණය මාස 06 ක කාල පරිච්ඡේදය තුළ අයකර ගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු රු.300,000 ක ණය මුදල වෙනුවෙන් පොලී සහ දඩ මුදල් ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව ණය අයකර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | රාජ්‍ය බැංකුවල කළ ආයෝජන කල් පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල වුවද, 2017 වර්ෂයේ සිට මාස 06 ක කෙටිකාලීන තැන්පතුවල රාජ්‍ය බැංකුවක ආයෝජනය කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන මුදල රු.9,201,093 ක් විය. | පිළිගනිමි. ඉදිරියේදී ලාභදායීම ආයෝජනයක ආයෝජනය කරමි. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධාන වලට අනුව මුදල් ආයෝජනය කළ යුතුය. |
| (ආ) | 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතේ 13 වගන්තියේ (අ) (ආ) (ඇ) සහ (ඈ) | වගන්තිවල නිශ්චිතව සඳහන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනිම සඳහා වැදගත්වන ඵලදායි සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් කුඩා රබර් වතු හිමියන්ගේ අවශ්‍යතාවය මත ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇත. | පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,222,288 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,469,974 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.752,314 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වියදම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 03 ක පුහුණුවීම් නොපැවැත්වූවද එම පුහුණුවීම්වලට සහභාගිවීමට නියමිතව සිටි රබර් කිරි කැපුම් ශිල්පීන් වෙත ලබාදීමට මිළදී ගෙන තිබුණු රු.1,719,984 ක් වටිනාකමැති විදුලි පන්දම්, මෙවලම් මළු, ටීෂර්ට් සහ මෙවලම් උපකරණ යනාදී වර්ග 10 ක් 2021 මැයි මාසය දක්වාම පාවිච්චියට ගැනීමකින් තොරව ගබඩාව තුළ පැවතුණි. | පුහුණු වැඩසටහන් 3 ට අදාල පුහුණු ලාභීන් වෙත ප්‍රදානය කිරීමට යෝජිත උපකරණ කට්ටල එසේ ඉතිරිවී ඇත. එහෙත් ඉහත දක්වා ඇති පරිදි 2021 වර්ෂයේදී ඉතිරිවී පවත්නා උපකරණ කට්ටල ප්‍රමාණයද පුහුණුලාභී ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කරන බව දන්වමි. | සැලසුම් කළ පරිදි පුහුණු පාඨමාලා පවත්වා පුහුණු උපකරණ නිසි පරිදි බෙදා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 14 ක ලියාපදිංචි තුරුසවි සමිති සංඛ්‍යාව 815 ක් වූ අතර මෙම සමිතිවලින් අක්‍රීය මට්ටමේ පවතින සමිති මෙතෙක් හඳුනාගෙන නොතිබුණි. කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 14 ක ලියාපදිංචි තුරුසවි සමිති සංඛ්‍යාව 815 ක් වූ අතර මෙම සමිතිවලින් අක්‍රීය මට්ටමේ පවතින සමිති මෙතෙක් හඳුනාගෙන නොතිබුණි. | කඩිනමින් සමිති වර්ගීකරණයට ලක්කර මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. | අක්‍රීය සමිති හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ස්ථාපිත කරනු ලැබූ ග්‍රාමීය රබර් සංසද 130 ක් හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 31 ක් ඵලදායි වන අයුරින් ක්‍රියාකාරීව පවත්වාගෙන යාමට තුරුසවිය වෙත පවරා ගන්නා ලෙස වැවිලි අමාත්‍යාංශයෙන් නියෝග දී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් එකී සංසද හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන තුරුසවිය අරමුදල පනත ප්‍රකාරව අරමුදල වෙත පවරාගැනීමට කටයුතු කරන බව දන්වමි. | අප්‍රමාදව පවරාගැනීමේ කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

-----------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයයේදී ඇඹේපොල සහ 2008 වර්ෂයේදී ගණේපල්ල රබර් ෂීට් සමූහ සැකසුම් මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීම ආරම්භ කර රු.1,000,184 ක් වියදම් කර තිබුණි. කෙසේ වුවද සැකසුම් මධ්‍යස්ථාන දෙකෙහි ඉදිකිරීම් ආරම්භකර වර්ෂ 15 කට වැඩි කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම අවසන් කර නොතිබුණි. | අදාල සමූහ සැකසුම් මධ්‍යස්ථාන වල කටයුතු සඳහා තුරුසවිය අරමුදල මගින් වෙන් කරන ලද මුදලට ප්‍රාමාණිකව ඉදිකිරීම් කටයුතු සිදුකර ඇතත්, එකී ගිවිසුම ප්‍රකාර තත් සමිතියේ දායකත්වයට අදාලව සිදුවිය යුතු ඉතිරි වැඩ ශේෂය සිදු වී නොමැති බව නිරීක්ෂණය කරමි. ඒ අනුව ඉතිරි වැඩ කොටස ඔවුන්ගේ වියදමින් සිදු කිරිමට දන්වා ඇත. | ඉදිකිරීම් වැඩ කඩිනමින් නිම කරවා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් අරමුදල වෙත ලැබී තිබුණු රු.2,000,000 ක් වටිනාකමැති මෝටර් වාහනයක් ධාවනය කිරීමට නොහැකිව පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | මෙම වාහනය අළුත්වැඩියා කිරිමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | **වාහනය අලුත්වැඩියා කළ යුතුය.** |